# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමියන්ගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරයි

***නොවැම්බර් 9, කොළඹ, ශ්‍රී ලංකාව:*** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමියන්ගේ අභාවය පිළිබඳව සිය ශෝකය පළ කර සිටී.

අතිගරු සෝභිත හිමියෝ ජනතාවාදී ඒකාධිපතිවාදය පරාජය කිරීමේ සටනෙහි ප්‍රමුඛ සිවිල් සමාජ ක්‍රියාකාරකයෙක් වූහ. උන් වහන්සේගේ ක්‍රියාශීලී නායකත්වය හා පෞරුෂය නිසා සමාජ සාධාරණත්වය සඳහා වූ ව්‍යාපාරය දූෂණයට හා ඒකාධිපතිවාදයට එරෙහි ප්‍රධාන ප්‍රවාහයේ මතය බවට පත් වීමටත් එම මතය ශක්තිමත් කිරීම සඳහා උදව් කිරීමටත් සමත් වූයේ ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම සිවිල් සමාජ නායකයාට සිය ආචාරය පුද කර සිටී. විශේෂයෙන් ම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ මේ තීරණාත්මක මොහොතේ දී උන් වහන්සේ අඛණ්ඩව, තර්කානුකූලව හා සිත් කා වදින අයුරින් පළ කරන අදහස් අහිමි වී යාම අපට ඉමහත් වේදනාවට කරුණකි.

පූජ්‍ය පක්ෂයේ හා සිවිල් සමාජයේ ගෞරවනීය සාමාජිකයෙකු වූ අතිපූජ්‍ය සෝභිත හිමියෝ වෙනස අවශ්‍ය කළ අයගේ අදහස් ප්‍රකාශයට පත් කිරීමට සමත් වූ අතර වඩා මෑත කාලයේ දී එම වෙනස මේ දක්වා කාලය තුළ අත් කර ගෙන තිබෙන වේගය හා ගුණාත්මකත්වය ගැන සිය කනස්සල්ල පළ කර සිටියහ. අන් බොහෝ දෙනෙකුට වඩා හොඳින් තත්ත්වය අවබෝධ කර ගත් උන් වහන්සේ ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ දී සිවිල් සමාජයේ ප්‍රධාන කාර්ය භාරය වන්නේ පාලනය හා සම්බන්ධ මහජන කටයුතුවල දී අඛණ්ඩව ප්‍රායෝගිකව ක්‍රියාකාරී වීම හා පාර්ශ්වකරුවන් බවට පත් වීම හරහා සදාකාලිකව සුපරීක්ෂාකාරී වීම බව කිසිදු සැකයකින් තොරව ප්‍රකාශ කර සිටියහ.

උන් වහන්සේට නිවන් සුව ප්‍රාර්ථනා කරමු.